# සොබා

පාරිසරික හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය

අනුග්‍රහය

නොරාඩ් පාරිසරික සහයෝගිතා වැඩසටහන

ප්‍රධාන සංස්කාරක

**සුනිල් සරත් පෙරේරා**

සහකාර සංස්කාරක

**එච්. එම්.ආර්. බී. හේරත්**



1992 ජූනි මස 3 – 14 දක්වා බ්‍රසීලයේ පැවැත්වෙන
පරිසරය හා සංවර්ධනය පිළිබඳ
එක්සත් ජාතීන්ගේ සමුළුව
සැමරිම සඳහා
නිකුත් කැරෙන සොබා විශේෂ කලාපය

LIBRARY
Ministry of Environment &
Natural Resources.

මිහි තල සමුළුව '92
පරිසරය හා සංවර්ධනය පිළිබඳ
එක්සත් ජාතීන්ගේ සමුළුව.



අතිගරු ජනාධිපති
ශ්‍රීමත් රණසිංහ ප්‍රේමදාස මැතිතුමා

### ශ්‍රී ලංකා ජනාධිපති
### இலங்கை சனாதிபதி
### President of Sri Lanka

මීට දශක දෙකකට පමණ ඉහත දී ජාතීන්ගේ ප්‍රජාව ගෝලීය පාරිසරික කාර්ය සටහනක් සම්මත කර ගැනීම සඳහා ස්ටොක්හෝම් නුවරට රැස් වූහ. බ්‍රසීලයේ පැවැත්වීමට නියමිත, පරිසරය හා සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සමුළුවේ දී ජාතීන්ගේ ප්‍රජාව 1992 ජූනි මාසයේ දී නැවත රැස්වනු ඇත. වේගයෙන් පිරිහීගෙන යන අපේ සම්පත් පදනමේ ප්‍රවර්තනීය සංවර්ධනය අපේක්ෂා සහගත අයුරින් සහතික කරන උපාය මාර්ග කෙරෙහි මෙකී ජාත්‍යන්තර සමුළුව අවධානය යොමු කරනු ඇත.

ජෛව විවිධත්වය, දේශගුණික විපර්යාසය සහ නිවර්තන වනාන්තර පාරිසරික වශයෙන් පිළිගත හැකි අයුරින් පෞද්ගලික ප්‍රයෝජනයට ගැනීම වැනි ගෝලීය වැදගත්කමකින් යුත් ප්‍රශ්න පිළිබඳ ව ජාත්‍යන්තර සම්මුතියකට එළඹීම සඳහා වූ පොදු වේදිකාවක් බ්‍රසීල සමුළුව මගින් සැපයෙනු ඇත. මිහිතල ප්‍රඥප්තියක් සම්පාදනය කිරීමට එය සැලසුම් කරයි. තව ද පිළිගැනීම හා ක්‍රියාත්මක කිරීම සඳහා 21 වැනි සියවසේ ප්‍රවර්තනීය සංවර්ධනය පිළිබඳ ක්‍රියාත්මක වැඩසටහනක් ද සම්පාදනය කරනු ලබනවා ඇත. ඌන සංවර්ධනය සහ පරිසර හායනය පිළිබඳ විෂම චක්‍රය කැඩීමට නම් සංවර්ධනය වන රටවල සංවර්ධන වේගය සැලකිය යුතු අයුරින් වැඩි කළ යුතු වේ. ප්‍රවර්තනීය සංවර්ධනය ඇති කර ගැනීම සඳහා මූලික පූර්ව අවශ්‍යතාවක් වනුයේ දුප්පත්කම සහමුලින් තුරන් කර දැමීමයි.

මේ ප්‍රයත්නයෙහි ලා ජාත්‍යන්තර ප්‍රජාවගේ ආධාරය සංවර්ධනය වන රටවලට අවශ්‍ය වේ. තුන්වැනි ලෝකයේ පවත්නා දුප්පත්කමට ප්‍රධාන හේතුව වී ඇත්තේ ගෝලීය ආර්ථික අසමතාව බැවින් මෙය නිශ්චය වශයෙන් ම එසේ වේ. තම සංවර්ධන වැඩසටහන් තුළට පාරිසරික මානයන් ඇතුළත් කර ගැනීම සඳහා සංවර්ධනය වන රටවලට අවශ්‍ය අතිරේක මූල්‍ය සම්පත් පිළිබඳ ප්‍රශ්නය කෙරෙහි බ්‍රසීල සමුළුව අවධානය යොමු කරනු ඇතැයි අපේක්ෂා කැරේ.

බ්‍රසීල සමුළුව විසින් ගනු ලැබීමට නියමිත තීරණ මිනිස් වර්ගයාගේ අනාගතය කෙරෙහි වැදගත් අයුරින් බලපානු ඇත. ප්‍රඥාව සහ අපගේ ග්‍රහ ලෝකයේ වාසය කරන දස ලක්ෂ සංඛ්‍යාත ජනතාව පිළිබඳ ප්‍රවේදිතාව ද විසින් එහි සාකච්ඡාවට ගැනෙන කරුණු වලට මග පෙන්වනු ලැබේවා!

ආර්. ප්‍රේමදාස
ජනාධිපති

1992 ජූනි මස 3 වැනි දින



LIBRARY

LIBRARY
Ministry of Environment &
Natural Resources.



State Printing Corporation, Sri Lanka.